පන්නල ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පන්නල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනව 2011 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ගෙන ඇති අගයන් අතර ලෙජර් ගිණුම් 5 කට අදාල රු.203,353,036 ක වෙනස්කම් පැවතුණි.

(ආ). වර්ෂය තුල උසාවි දඩ ලෙස ලැබි තිබූ රු.11,182,813 කට වර්ෂයේ බිල්කිරීම් වන රු.10,015,000 ක වටිනාකමද එකතු කර රු.21,197,813 ක් වර්ෂයේ ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබීම මත අතිරික්තය හා ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.11,182,813 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය හා ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ලබාගත් ණය වෙනුවෙන් ගෙවිය යුතු ණය මුදල රු.62,036,763 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල ණය ප්‍රාග්ධනය ලෙස රු.58,272,183 ක් පමණක් දක්වා තිබීම මත වර්ෂය අවසානයට ණය ප්‍රාග්ධනය රු.3,764,580 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඈ). භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව පුස්තකාල පොත්වල වටිනාකම රු.11,962,689 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.9,732,482 ක් ලෙස ගෙන තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පුස්තකාල පොත් වටිනාකම රු.2,230,207 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඉ). ණයගැතියන් (වෙනත්) ලෙස ලේඛන අනුව තහවුරු වූ ප්‍රමාණය රු.95,632,958 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.122,677,278 ක් ලෙස ගෙන තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණය ගැතියන් රු.27,044,320 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඊ). උපලේඛන අනුව තහවුරු වූ තත්‍ය වියදම් ණයහිමි ශේෂය රු.103,218,727 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.77,705,790 ක් ලෙස දක්වා තබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණය හිමියන් රු.25,512,937 අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(උ). 2011 වර්ෂයේ ණය හිමියන් වෙනුවෙන් වැඩිපුර වෙන්කර තිබූ රු.1,544,500 ක් ගැලපුම් කිරීමේදී රු.44,500 ක් ලෙස පොදු සැපයුම් ණයහිමි ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කර තිබීම මත සමාලෝචිත වර්ෂය අවසානයට පොදු සැපයුම් ණය හිමියෝ රු.1,500,000 ක් වැඩියෙන්ද සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ගිණුම් ගතකර තිබුණි.

(ඌ). එකවර ගෙවන මුදල් ක්‍රමයට (කීමනී) ලබාගෙන ඇති කඩ වෙනුවෙන් ලැබෙන මුදල් සභාවේ ආදායමක් ලෙස හඳුනා ගෙන ගිණුම් ගත නොකර වර්ෂය ආරම්භයට පැවති රු.3,160,186 ක ශේෂයට වර්ෂය තුල ලැබී තිබූ රු.1,874,691 ක් එකතු කර රු.5,034,877 ක් ගෙවිය යුතු එක්වන් මුදල්, තැන්පත් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.1,874,691 ක් අඩුවෙන්ද සමුච්චිත අරමුදල රු.3,160,186 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

(එ). අවිනිශ්චිත ස්වභාවයේ ගිණුම්වල හර ශේෂ එකතුව රු.73,766 ක් වූ අතර, ලෙජර් ගිණුම් අනුව එකී ශේෂය රු.176,367 ක් විය. එමෙන්ම 2011 වර්ෂය ආරම්භයට රු.37,383,062 ක්ව පැවති අවිනිශ්චිත ගිණුමේ හර ශේෂයට 2011 වර්ෂය තුල ජනල් සටහන් මගින් සාවද්‍ය ලෙස ගැලපුම් කර තිබූ රු.43,821,632 ක ශේෂයන් නිරවුල් කළේ නම් අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.43,645,264 ක හර ශේෂයක් ලෙස පැවතිය යුතුව තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.297,309,043 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,155,518 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,730,118 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). වර්ෂ ගණනාවක සිට අයනොවී පවතින රු.101,484 ක් වූ සේවක ණය ශේෂය හා රු.18,708,947 ක ලැබිය යුතු මූලධන ආධාර ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ආ). ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ලබාගෙන තිබූ රු.මිලියන 60 ක පමණ ණය සඳහා වූ වාරික මුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් රු.265,809 ක පමාද දඩ මුදලක් උපචිතව පැවති අතර, රු.2,306,887 ක ණය වාරිකද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගෙවා නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 7,441 | 6,577 | 3,138 |
| (ii) | බදුකුලී | 21,579 | 17,455 | 1,911 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,486 | 1,444 | - |
| (iv) | වෙනත් ආදායම් | 72,808 | 71,258 | - |

### 2.3.2 වරිපනම් බදු

වසර 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරවා එම තක්සේරුව මත වරිපනම් බදු අයකළ යුතු වුවද, 2006 වර්ෂයේ සිදුකළ තක්සේරුව මත 2012 වර්ෂයේ වරිපනම් බදු අයකර තිබුණි. වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.2,535,889 ක් වූ අතර එය වාර්ෂික බිල්කිරීම වූ රු.4,040,059 න් 63% ක් පමණ විය. එමෙන්ම හමන්ගල්ල උපකාර්යාලයට අයත් වරිපනම් ඒකක 672 ක් අතුරින් මීගමුපාර වම වරිපනම් ඒකක 111 හා මීගමුපාර දකුණ වරිපනම් ඒකක 143 කට අදාලව සිදුකල නියදි පරීක්ෂාවට අනුව 2012 දෙසැම්බර් 31 දිනට කාර්තු 3 ත් 27 අතර පරාසයක අයනොවූ රු.76,529 ක ශේෂයක් පැවතුණි. මෙකී හිඟයන් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 31-42 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3.3 <u>බදුකුලී</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). මාසිකව රු.2,750 බැගින් 2011 මාර්තු සිට තරුණ සේවා සභාවට කුලියට දී ඇති යක්විල උපකාර්යාලයට අයත් ගොඩනැගිල්ල සඳහා මාසික වාරික 22 ක් ලෙස රු.60,500 ක් සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අයවීමට තිබූ අතර, මෙකී හිඟ සම්බන්ධව දඩ බිල් කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ආ). මාසික කුලිය රු.650 කට ලබාදී තිබූ මාකදුර නගරයේ පිහිටි සභා ගොඩනැගිල්ලට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට මාසික වාරික 354 ක ලෙස රු.230,240 ක් අයවීමට තිබුණි.

(ඇ). හමංගල්ල උපකාර්යාලයට අයත් 2003 වර්ෂය වන විට කඩා ඉවත්කර තිබූ පදික කඩ වලට අදාලව පැවති රු.12,480 ක හිඟ ශේෂයක් හා නිවාස කුලී යටතේ 2012 දෙසැම්බර් 31 දින වන විට බිල් කිරීම් සිදු නොවන ස්ථාන 4 කට අදාලව රු.42,291 ක හිඟ ශේෂයක්ද පැවතුණි.

(ඈ). සිනමාශාලාවක් පවත්වාගෙන යාම සඳහා හමංගොල්ල උපකාර්යාලයට අයත් ගොඩනැගිල්ලක් කුලියට දී තිබූ අතර 2007 ජුනි 30 දක්වා කාලයට බිල්කිරීම් මත රු.378,785 ක හිඟයක් පැවතුණි. එමෙන්ම 2007 ජූලි සිට මෙකී ගොඩනැගිල්ලට අදාලව කුලි මුදල් බිල්කිරීමක් සිදුව නොපැවති අතර එකී ගොඩනැගිල්ල නිශ්චිත කාර්යකට යොදා නොතිබුණි.

(ඉ). සභා ගොඩනැගිල්ලක ගිරිඋල්ල පොලිස් ස්ථානය පවත්වාගෙන යනු ලබන අතර ඊට අදාලව 2003 ජුනි 01 දක්වා රු.299,234 ක් හිඟව තිබූ අතර එදින සිට කුලී බිල් කිරීමක්ද සිදුව නොතිබුණි.

(ඊ). ගිරිඋල්ල පොදු වෙළඳපලට අයත් කඩ කාමර 48 න් කඩ කාමර 18 ක් 2007-2010 කාල පරිච්ඡේදයට අදාලව, කුලී මුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් මුද්‍රා තබා තිබූ අතර, එකී කඩ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 21 දිනැති අංක 1980/46 චක්‍රලේඛයේ විධිවිධාන පරිදි නැවත ටෙන්ඩර් කර බදුදීමක් සිදුව නොතිබුණි. එමෙන්ම මෙකී කඩ සම්බන්ධව මුද්‍රා තබන අවස්ථාවට පැවති එකතු වටිනාකම වූ රු.195,592 ක් වූ හිඟ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකරගෙන නොතිබුණි.

(උ) කදානේ ගෙදර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10 න්, එක් කඩ කාමරයක් රු.1,000,000 (කිමනී ක්‍රමයට) එකවර ගෙවන ක්‍රමයට බදුදීම සඳහා 2012 ජනවාරි මස මිල ගණන් කැඳවා තිබූ අතර කඩ කාමර 2 ක් පමණක් බදුදී තිබුණි. ඉතිරි කඩ කාමර 8 බදුදීම සඳහා නැවත අවස්ථා 5 කදී ටෙන්ඩර් කළද වර්ෂය අවසානය දක්වාම බදුදීමට නොහැකි වී තිබුණි. බදුදුන් කඩ කාමර 2 ට අදාලවද වර්ෂය අවසානයට එකවර ගෙවන මුදල් යටතේ රු.1,009,773 ක් හිඟව පැවති අතර එකී කඩ සම්බන්ධවද ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

(ඌ) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ රු.85,254,744 ක් වැය කර 2010 වර්ෂයේදී ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ලෙහි බිම් මහලෙහි කඩ කාමර 24 ක් අවම ලංසුව රු.7,749,000 ත් රු.380,000 ත් අතර පරාසයක සහ අංක 25 දරණ උඩුමහල රු.11,106,000 ක එකවර ගෙවන ක්‍රමය යටතේ ලබා දීමට 2011 හා 2012 වර්ෂ වලදී අවස්ථා 4 කදී රු.140,608 ක් වැයකර මිල කැඳවුවද, කඩ කාමර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ලබා දමට නොහැකි වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානය වන විට පොදු පහසුකම් සැපයිමට සභාව වැය කල රු.මිලියන 5 ක් පමණ ඇතුළුව රු.මි.90 ක් පමණ වැයකර ඇති මෙකී ව්‍යාපෘතියට අදාලව, ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් ණය වෙනුවෙන් 2011 වර්ෂයේදී ණය පොලී වශයෙන් රු.2,419,131 ක්ද, 2012 වර්ෂයේ දී ණය වාරික හා පොලී වශයෙන් කාර්තු 3 ක් සඳහා රු.2,380,920 ක් ද වශයෙන් ගෙවා තිබුණද, මෙම ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාල කාර්යයන්ට යෙදවීම හෝ කඩ කාමර කුලියට දීමට හෝ සිදුව නොතිබුණි.

(එ) එකවර ගෙවන මුදල් හා සභා අරමුදල් යටතේ රු.මිලියන 9 ක පමණ පිරිවැයක් යටතේ 2004 වර්ෂයේ වැඩ ආරම්භ කර තිබූ කඩ කාමර 24 කින් සමන්විත වූ වැටකෙයියාව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 8 ක් එකවර ගෙවන ක්‍රමය යටතේ බදුදීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නොහැකි වී තිබුණි. එමෙන්ම එකවර ගෙවන ක්‍රමයට ලබාගත කඩ කාමර වලින් කඩ කාමර 3 කට අදාලව රු.745,330 ක හිඟයක් පැවතුණි. වර්ෂය අවසානය දක්වාම විදුලි පහසුකම් ලබා නොතිබීම හා පොදු පහසුකම් නොමැති වීම හේතුවෙන් මෙකී වෙළඳ සංකීර්ණය විවෘත කර කුලී මුදල් අයකිරම වර්ෂය අවසානය දක්වාම සිදුව නොතිබුණි.

2.3.4 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

(අ). සභාව විසින් ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර බිල් කිරීම් වලට අදාලව 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 59 හා 67 දක්වා ඇති විධිවිධාන පරිදි වූ සමීක්ෂණය පවත්වා නොතිබුණි.

(ආ). ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන අනුව එම හෝටලයේ හෝ ආපන ශාලාවේ පිරිවැටුම මත 1% ක් නොඉක්මවන ගාස්තුවක් අයකරගත හැකි වුවද, සභාව විසින් එලෙස හඳුනාගෙන තිබූ එක් ආයතනයක් සඳහා 2012 වර්ෂයේ රු.3,000 ක ගාස්තුවක් පමණක් අයකර තිබුණි.

2.3.5 <u>වාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශයේ වාහන නැවැත්වීමට අදාලව අතුරු ව්‍යවස්ථාවක් පැවතියද ත්‍රීරෝද රථ නැවැත්වීමට අදාලව වාර්ෂිකව හෝ කාලානුරූපීව සමීක්ෂණයක් කර සභා බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ ලියාපදිංචිය හෝ නැවතුම් ස්ථාන විධිමත් කිරිමක් සිදුව නොතිබුණි.

2.3.6 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ප්‍රමාණය හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

2.4 මානව සම්පත් කළමනාකරණය

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 111 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 95 ක් ද ලෙස පුරප්පාඩු 23 ක්ද අතිරික්ත 07 ක්ද පැවතුණි. එතුල වූ කාර්මික නිළධාරි තනතුරු 4 න් 1 ක්ද පුස්තකාලයාධිපති තනතුරු 4 න් 2 ක්ද, අනුමත ආදායම් පරිපාලක තනතුරු හතරමද පුරප්පාඩුව පැවතුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂය අවසන් වන විට අනියම් හා ආදේශක පදනම මත සහා අරමුදලින් වැටුප් ලබන සේවකයින් 85 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය වන විට පුස්තකාල සහායක තනතුර අනුමත සංඛ්‍යාව 06 ක් වූ අතර ඒ යටතේ ස්ථිර සේවකයින් 4 දෙනෙකු සිටි අතර 17 දෙනෙකු අනියම් හා ආදේශක පදනමට සමාලෝචිත වර්ෂය අවසානය වන විට සේවයේ යොදවා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය වන විට ළදරු පාසැල් පාලිකා තනතුරු අනුමත සංඛ්‍යාව 04 ක් වූ අතර ඒ යටතේ ස්ථිර සේවකයින් නොසිටි අතර 42 දෙනෙකු අනියම් හා ආදේශක පදනමට සමාලෝචිත වර්ෂය අවසානය වන විට සේවයේ යොදවා තිබුණි.

2.5 සභාවට එරෙහිව හෝ සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කරුණු

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). සංවර්ධන සභා කාලයේදී සභාවට මිළදීගෙන තිබූ යක්විල දම්මින්න ගහමුල වත්ත ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් පිළිවෙලින් 1998 හා 2012 වර්ෂ වලදී කුලියාපිටිය දිසා අධිකරණයේ හා කුරුණෑගල සිවිල් අභියාචනාධිකරණයේ නඩු 2 ක් විහාග වෙමින් පැවතුණි.

(ආ). යන්ත්‍රෝපකරණ අධිකාරියට අයත් මෝටර් ග්‍රේඩරය සභාවේ සේවකයකු විසින් ක්‍රියාකරවීමේදී එයට පුද්ගලයකු යටවී මරණයට පත්වීමට අදාලව 2011 වර්ෂයේදී කුලියාපිටිය දිසා අධිකරණයේ නඩුවක් විහාග වෙමින් පැවතුණි.

(ඇ). හමන්ගල්ල උපකාර්යාල බල ප්‍රදේශයේ පානීය ජල ව්‍යාපෘතියක් සඳහා ජලනල එලීමේදී පෞද්ගලික ඉඩම් අයිතිකරුවන් විසින් ජලනල එලිමට එරෙහිව විරෝධය පැම හේතුවෙන් 2008 වර්ෂයේදි කුලියාපිටිය දිසා අධිකරණයේ නඩුවක් විහාග වෙමින් පැවතුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

ඍජු ශ්‍රම පදනම මත සිදුකල කර්මාන්ත

පළාත් නිශ්චිත හා පළාත් ආයෝජන යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රු.4,279,700 ක් වූ කර්මාන්ත 11 ක් හා සහා අරමුදල් මත කර්මාන්ත 147 ක් වශයෙන් කර්මාන්ත 158 ක් 2012 වර්ෂය තුල සභාව විසින් ඍජු ශ්‍රමය යටතේ ක්‍රියාත්මක කර තිබූ අතර එම කර්මාන්ත ලිපිගොනු පිළියෙල කිරීමේදී 2003 දෙසැම්බර් 09 දිනැති අංක 7/6/8 දරන සිවිල් ඉංජිනේරු කර්මාන්ත ඉටුකිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත නැමති පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 07 වගන්තිය ප්‍රකාරව පැවතිය යුතු තොරතුරු නිසි පරිදි ඇතුලත් කර නොතිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). සභාවට අදාලව සංයුක්ත සැලැස්මක් හා සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු…4,188,492 ක් ව තිබුණි.

2.8 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂය වන විට රු.2,226,000 ක් වැයකර තිබූ අතර මධ්‍යස්ථානය මගින් මසකට මෙට්‍රික් ටොන් 1 ක පමණ කාබනික පොහොර නිෂ්පාදනයක් සිදුව පැවතුණි. ඊට අමතරව සභා බල ප්‍රදේශය තුල එකතුවන කසළ බැහැර කිරීම සඳහා විලගෙදර ප්‍රදේශයේ අක්කර පහක පමණ පෞද්ගලික ඉඩමක් යොදාගෙන පැවති අතර එම ඉඩමට ආසන්නව පාසැලක් හා වැඩිහිටි නිවාසයක් පැවති අතර මා ඔයද ඒ අසල පිහිටා තිබුණි.

2.9 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය අනුව සුභසාධන කාර්යයන් 6 ක් වෙනුවෙන් වෙන්කර තිබූ රු.1,210,000 ක ඇස්තමේන්තු වටිනාකම රු.979,422 ක් වූ ගමනැගුම ව්‍යාපෘති 01 ක් හා ඇස්තමේන්තු වටිනාකම රු.202,124 ක් වූ වෙනත් ප්‍රතිපාදන ව්‍යාපෘති 08 ක් වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). මානව සම්පත් කළමනාකරණය